යම් පුවතකට අදාළ නොවන අවස්ථාවන් හිදී පුද්ගලයන්ගේ වාර්ගිකත්වයන් සඳහන් කිරීමේ ඇති ගැටළුකාරී බවත්, එසේ සෘණාත්මක සන්දර්භයන් තුළ වාර්ගිකත්වයන් හුවා දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් සෘණාත්මකව ඒකාකෘතික විය හැකි බවත් Ethics Eye ඔස්සේ අපි නැවත නැවතත් පෙන්වා දී ඇත්තෙමු.

"අනුරාධපුර සාපෙළ සිසුවියන්ට අතවර කළ විභාග නිරීක්ෂක රිමාන්ඩ්" යන සිරස්තලය යටතේ සිළුමිණ පුවත්පතේ (ජුනි 05, 2022) පළවූ ලිපිය මෙම ගැටළුවට නිදසුනක් වේ. ලිංගික අතවර සිදුවීමක් පිළිබඳව වාර්තා කරන මෙහි සඳහන් වන්නේ, සිදුවීම සම්බන්ධව අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයා "මුස්ලිම් ජාතික" ගුරුවරයෙකු බවයි.

ඒ අනුව,

1) මෙහිදී එම සැකකරුගේ වාර්ගිකත්වය පුවතට අදාළ වන්නේ කෙසේද?
2) වාර්ගිකත්වය සඳහන් නොකරමින් පවා, එම පුවතට හානියක් නොවන ලෙසින් එය වාර්තා කිරීමට නොහැකි ද?
3) එසේ වාර්ගිකත්වය හුවා දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වය සෘණාත්මකව ඒකාකෘතික වීමටත්, ඒ ඔස්සේ කොන් කිරීමකට ලක් වීමටත් ඉඩක් නොතිබෙන්නේ ද?

මෙම සිදුවීම පිළිබඳව මීන් පෙර අප සඳහන් කළ පෝස්ටුවට ප්‍රවේශය මෙතැනින්:
**https://www.facebook.com/228455347509530/posts/1686768578344859/**

අදාළ නොවේනම් වාර්ගිකත්වයන් ඉස්මතු නොකරමු!